නොරොච්චෝලේ ලක්විජය ගල් අඟුරු බලාගාරය සඳහා 2022-2025 කාලපරිච්ඡේදයට අදාළව ගල් අඟුරු මිලදී ගැනීමේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය ඇගයීම සම්බන්ධයෙන් පොදු ව්‍යාපාර කාරක සභාව මඟින් විමර්ශනය කරන ලද විශේෂ විගණන වාර්තාව සහ විමර්ශනයට ලක් කරන ලද කරුණු සම්බන්ධව සී/ස ලංකා කෝල් (පුද්) සමාගම ගෙන ඇති ක්‍රියාමාර්ග

2022 සැප්තැම්බර් 30 දිනැතිව ජාතික විගණන කාර්යාලය විසින් නොරොච්චෝලේ ලක්විජය ගල් අඟුරු බලාගාරය සඳහා 2022-2025 කාලපරිච්ඡේදයට අදාළව ගල් අඟුරු මිලදී ගැනීමේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය ඇගයීම සම්බන්ධයෙන් වූ විශේෂ විගණන වාර්තාව අනුව ගල් අඟුරු මිලදී ගැනීම විධිමත් කිරීම සඳහා නිර්දේශ 08 ක් ඉදිරිපත් කර තිබුණි. පොදු ව්‍යාපාර කාරක සභාව විසින් 2022.11.09 දින පැවැති කාරක සභා රැස්වීමේ දී විගණකාධිපතිගේ නිර්දේශ එලෙසින්ම අනුමත කර ඇත. ඒ අනුව 2022 නොවැම්බර් මාසයෙන් පසුව සිදු කරන ලද සියලුම ටෙන්ඩර් සඳහා ඉහත කී නිර්දේශ අනුගමනය කරන ලෙසට අමාත්‍යාංශය විසින් ගල් අඟුරු සමාගම වෙත උපදෙස් ලබා දෙන ලද අතර, එම නිර්දේශ ප්‍රකාරව කටයුතු කරන බවට මම සැහීමකට පත්වෙමි. විගණකාධිපතිගේ නිර්දේශ 08 සම්බන්ධයෙන් එලෙස අනුගතව කටයුතු කරන බවට ගල් අඟුරු සමාගමේ සභාපති ලබා දී ඇති වාර්තාවේ ඇතුළත් කරුණු සමඟ මම එකඟ වෙමි.

තවද, නොරොච්චෝලේ ලක්විජය ගල් අඟුරු බලාගාරය සඳහා 2022-2025 කාලපරිච්ඡේදයට අදාළව ගල් අඟුරු මිලදී ගැනීමේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය ඇගයීම් සම්බන්ධයෙන් විශේෂ වාර්තාවක් පාර්ලිමේන්තුවේ සභාගත කරන ලෙස කාරක සභාව විසින් ලබාදුන් නිර්දේශය අනුව ලංකා ගල්අඟුරු පුද්ගලික සමාගම ඉදිරිපත් කර ඇති වාර්තාව මා විසින් නිර්දේශ කරමි.

ආචාර්ය සුලක්ෂන ජයවර්ධන
ලේකම්
විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය

23.01.2024
දිනය

ආචාර්ය සුලක්ෂණ ජයවර්ධන
ලේකම්
විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය
අංක 80, ශ්‍රීමත් අර්නස්ට් ද සිල්වා මාවත,
කොළඹ 7.

පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ දෙවැනි වාර්ථාව -සී/ස ලංකා ගල්අඟුරු (පුද්) සමාගම

සී/ස ලංකා කෝල් (පුද්) සමාගම විසින් ගල් අඟුරු ප්‍රසම්පාදනයේදී අනුගමනය කරනු ලබන්නේ පහත පිළිවෙතයි.එහිදි ලියාපදිංචි ගල්අඟුරු සැපයුම්කරුවන් අතරින් දිගුකාලින ටෙන්ඩර් සහ ක්ෂණික ටෙන්ඩර් මගින් ගල් අඟුරු ප්‍රසම්පාදනය කරගැනිම සිදුවේ. එක් වාරයක ගල් අඟුරු අවශ්‍යතාවය වාර දෙකක් තුළ සැපයීම දිගුකාලින ටෙන්ඩරය මගින්ද, එක් වාරයකට අවශ්‍ය ගල්අඟුරු ප්‍රමාණයේ ඉතිරිය (දිගුකාලින ටෙන්ඩරයෙන් ලබාගන්නා ප්‍රමාණය හැර) ක්ෂණික ටෙන්ඩර් මගින්ද සපයා ගනු ලැබේ. නිදසුනක් ලෙස එක් වාරයක ගල් අඟුරු අවශ්‍යතාවය මෙ.ටො.2,250,000 බැවින් දිගුකාලින ටෙන්ඩරයෙන් එක් වාරයක් තුළ මෙ.ටො 1,125,000 ක් ද ඉතිරිය ක්ෂණික මිලදී ගැනිම් මගින්ද සපයා ගනු ලබයි.

සැපයුම්කරුවන් ලියාපදිංචි කිරිම

ගල්අඟුරු ප්‍රසම්පාදනය කිරිම සඳහා සුදුසුකම් ඇති සැපයුම්කරුවන් ලියාපදිංචි කරගැනිම ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුකූලව පලමුව සිදුකරනු ලැබේ. එහිදි සැපයුම්කරුවකුගේ වලංගු ලියාපදිංචි කාලය වසර 03 ක්වන අතර අනතුරුව එම සැපයුම්කරු ඒම කාල සීමාවෙන් ඔබ්බට සැපයුම්කිරිමට අපේක්ෂා කරන්නේනම් නැවතත් ලියාපදිංචි විය යුතුවේ.

ගල්අඟුරු සැපයුම්කරුවකු ලෙස ලියාපදිංචිකරගැනිම සඳහා පහත නිර්නායක සලකා බලනු ලැබේ. මෙම ඉල්ලුම්කාර සමාගම් පිලිබදව අදාල රටේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය මගින් එම සමාගම අදාල රාජ්‍ය තුළ ස්ථාපිත සමාගමක්ද යන්න තහවුරු කරගනු ලැබේ. සැපයුම්කරුවකු ඇඩො.5,000 ක නැවත නොගෙවන තැන්පතුවක් ලබාගෙන වසර තුනක කාලයක් සඳහා ලියාපදිංචි කරනු ලැබේ. දැනට මේ ආකාරයට සැපයුම්කරුවන් 17ක් ගල් අඟුරු සමාගමේ ලියාපදිංචි වී සිටියි. පොරොත්තු ලේඛණයේ තවත් සමාගම් 16ක් ලියාපදිංචිය සඳහා සිටියි. සෑම සතියකම වැඩ කරන සදුදා දිනවල (රජයේ නිවාඩු දිනයන් නොවන) අළුතින් සැපයුම්කරුවන් ලියාපදිංචි කරගැනිම සඳහා අයදුම්පත් භාරගන්නා අතර ක්ෂණික ප්‍රසම්පාදනය සඳහා පත්කර ඇති ලංසු විවෘත කිරීමේ කමිටුව මඟින් එම අයදුම්පත් විවෘතකර විශේෂ තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් සුදුසුකම් පරීක්ෂා කර බලා අදාල නිර්නායක වලට ගැලපෙන්නේනම් පමණක් විශේෂ ස්ථාවර ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතියෙන්, ඇඩො. 5000 තැන්පතුව ලබාගෙන ලියාපදිංචිය සිදුකරනු ලබයි.

දිගුකාලින ප්‍රසම්පාදනය

එක් වාරයක ගල් අඟුරු අවශ්‍යතාවය වන මෙ.ටො. 2,250,000 ක (අඩු හෝ වැඩි 10%ක් සහිත) ප්‍රමාණය ගල්අඟුරු වාර දෙකක් තුළ සැපයුම සඳහා ටෙන්ඩර් ක්‍රියාවලිය මගින් (ජාත්‍යන්තර සීමිත ලංසු කැඳවීම) ලියාපදිංචි සැපයුම්කරුවන්ගෙන් ලංසු කැඳවීමෙන් පසු සුදුසු සැපයුම්කරු තෝරා ගනු ලබයි. මෙහිදි ලියාපදිංචි සැපයුම්කරුවන් වෙතින් තරගකාරි ලංසු කැඳවන අතර එම ලංසු තාක්ෂණික ඇගයීම් කමිටුවක් වෙත යොමුකරනු ලබයි. එම තාක්ෂණික ඇගයීම් කමිටු වාර්තාව අමාත්‍ය මණ්ඩලය විසින් පත්කරනු ලබන ස්ථාවර ප්‍රසම්පාදන කමිටුවට යොමුකරනු ලැබේ. ඇගයීම් කරන ලද අවම ප්‍රතිචාරාත්මක ලංසුකරු පිලිබද අනෙකුත්

ලංසුකරුවන් දැනුවත් කරනු ලබන අතර ඒ සම්බන්ධව විරෝධතා ඇත්නම් සතියක් තුළ දැනුම්දෙන ලෙස ද රේඛිය අමාත්‍යාංශයේ ලේකම් මගින් අනෙකුත් ලංසුකරුවන් වෙත දැනුවත් කෙරෙයි.අනතුරුව එය අමාත්‍ය මණ්ඩලය වෙත යොමුකරනු ලබන අතර අමාත්‍ය මණ්ඩල අනුමැතිය හිමිවීමෙන් පසුව ටෙන්ඩරය ප්‍රදානය කිරීම සිදුවේ.

ක්ෂණික ප්‍රසම්පාදනය (Spot Tender)

2015.07.22 දිනැති කැබිනට් තීරණය ප්‍රකාරව ක්ෂණික මිලදී ගැනීම් ටෙන්ඩර ක්‍රියාත්මක වීම සිදුවේ. මෙහිදී එක් වාරයක ගල් අඟුරු අවශ්‍යතාවයෙන් දිගුකාලීන ටෙන්ඩරය මගින් ලබාගන්නා ප්‍රමාණය හැර ඉතිරි ප්‍රමාණය ක්ෂණික ප්‍රසම්පාදන මගින් සපයා ගැනීම සිදුකරනු ලබයි. එක් ක්ෂණික ප්‍රසම්පාදනයක් මගින් දළ වශයෙන් ගල් අඟුරු මෙට්‍රික් ටොන් 300,000 (අඩු හෝ වැඩි 10%ක් සහිත) ක ප්‍රමාණයක් (නැව් තොග 05ක් පමණ) සපයා ගැනීම සිදුවේ. මෙහිදී ද ලියාපදිංචි සැපයුම්කරුවන් අතරින් ලංසු කැඳවීම සිදුවේ. එහිදී ඉදිරිපත් වූ ලංසු ස්ථාවර තාක්ෂනික ඇගයීම් කමිටුවට යොමුකිරීමෙන් පසුව ඇගයීම් සිදුවේ. තාක්ෂණික ඇගයීම් කමිටුව අගයන ලද ලංසු අමාත්‍ය මණ්ඩලය විසින් පත්කරන ලද විශේෂ ස්ථාවර ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතිය ලබා දිය යුතුය. අමාත්‍ය මණ්ඩලය විසින් පත්කරන ලද විශේෂ ස්ථාවර ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතිය හිමිවීමෙන් පසුව අමාත්‍ය මණ්ඩල ආවරන අනුමැතියට යටත්ව අදාල ටෙන්ඩරය පිරිනැමීම සිදුකරනු ලබයි. අනතුරුව එලැඹෙන පළමු අමාත්‍ය මණ්ඩල රැස්වීමට මෙම ටෙන්ඩර් පිරිනැමීම අනුමැතිය සඳහා යොමුකරනු ලබයි

.....

සභාපති

ලංකා කෝල් පුද්ගලික සමාගම

Chairman
Lanka Coal Company (Pvt) Ltd.

නොරොච්චෝලේ ලක්විජය ගල් අඟුරු බලාගාරය සඳහා 2022-2025 කාලපරිච්ඡේදයට අදාළව ගල් අඟුරු මිලදී ගැනීමේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය ඇගයීම සම්බන්ධයෙන් වූ විශේෂ විගණන වාර්තාව සම්බන්ධයෙන් පොදු ව්‍යාපාර කාරක සභාව මඟින් විමර්ශනය කරන ලද විශේෂ විගණන වාර්තාව සහ විමර්ශනයට ලක් කරන ලද කරුණු සම්බන්ධව සී/ස ලංකා කෝල් (පුද්) සමාගම ගෙන ඇති ක්‍රියාමාර්ග

	පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් ඉදිරිපත් කරන ලද නිර්දේශ	සී/ස ලංකා කෝල් (පුද්) සමාගම ගෙන ඇති ක්‍රියාමාර්ග
01	ගල් අඟුරු ප්‍රසම්පාදන ක්‍රියාවලියට සම්බන්ධ සියළු පාර්ශව රජයේ අනුමත ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්ට අනුකූලව සිය වගකීම් නිවැරදිව ඉටු කරනු ලබන බවට තහවුරු කිරීම හා එම තත්ත්වයෙන් බැහැර වන පාර්ශවයන්ට එරෙහිව සුදුසු පියවර ගැනීමේ අවශ්‍යතාවය අවධාරණය කිරීම.	ප්‍රසම්පාදන කටයුතු නියමිත ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන් අනුකූලව ඉටු කරන ලෙස අවශ්‍ය පාර්ශවයන් වෙත උපදෙස් ලබා දී ඇත. ඇතිවන සුවිශේෂී තත්ත්වයන් මත ඉන් බැහැර වීමට සිදු වන්නේ නම් පමණක් අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගනු ඇත.
02	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 1.2 ඡේදයේ සඳහන් අරමුණු වලට අගතියක් නොවන පරිදි සහ සැපයුම්කරුවන්ගේ මූල්‍ය ශක්‍යතාවය, පලපුරුද්ද, සැපයුමේ ගුණාත්මකභාවය, ප්‍රමාණවත් නෛතික බැඳීම් ඇතුළු මූලික අවශ්‍යතාවයන් ආරක්ෂා වන පරිදි ලංසුකරුවන් ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලිය පිළිගත හැකි මට්ටමකට ලිහිල් කර තරඟකාරීත්වය උපරිම කර ගැනීම පිළිබඳව අවධානය යොමු කිරීම.	මේ සම්බන්ධව අවශ්‍ය කටයුතු දැනටමත් සිදුකර ඇත. ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 1.2 ඡේදයේ සඳහන් අරමුණු වලට අගතියක් නොවන පරිදි සහ සැපයුම්කරුවන්ගේ මූලික අවශ්‍යතා ආරක්ෂා වන පරිදි සංශෝධන ඉදිරිපත් කර ඇත. මෙමගින් වසර 03ක අත්දැකීම් ඇති අදාල ගල්අඟුරු සැපයුම්කරුවකුට සහභාගීවීමට ඉඩ සලසා දීමෙන් තරගකාරීත්වය වැඩි කර ඇති අතර ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලිය පිළිගත හැකි මට්ටමකට ලිහිල් කර ඇත. ලංකාවට පමණක් නොව වෙනත් රටකට ගල් අඟුරු සපයා පළපුරුද්දක් ඇත්නම් එම තත්වයන්ද සැලකිල්ලට ගෙන ඇත.
03	ලංසු ලේඛනයන්ට සංශෝධනයක් සිදු කිරීමේදී අදාළ තහවුරු කිරීම් සහ බැඳීම් වලට අගතියක් නොවන පරිදි එවැනි සංශෝධනයන්ගේ නීත්‍යානුකූලභාවය තහවුරු කර ගැනීමෙන් පසුව එවැනි සංශෝධනයන් සිදු කල යුතු අතර, එම සංශෝධනයට ගැලපෙන පරිදි ලංසු ලේඛනයෙහි අනෙකුත් වගන්ති හා ගිවිසුම් සංශෝධනය කිරීමට වග බලා ගත යුතුය. ලංසු කැඳවීමෙන් පසු ලංසු ලේඛනයන්ට ප්‍රබල සංශෝධනයක් කිරීමෙන් හැකි සෑම විටම වැලකී සිටිය යුතුය. ලංසු ලේඛනයන්ට පසුව කරන සංශෝධනයන්හිදී එම සංශෝධනයන්ට අනුගත වීම සඳහා සියළුම ලංසුකරුවන්ට සාධාරණ කාලයක් ලබා දීමට ක්‍රියා කිරීම.	මේ පිළිබඳව අවධානය යොමුකර ඇති අතර ඒ අනුව සියළුම ලංසුකරුවන්ට සාධාරණ කාලයක් ලබා දීමට හා ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්හි 5.3.15 හි විධිවිධාන අනුව ප්‍රසම්පාදන වලදී එකී සංශෝධනයන් සිදු කිරීමෙන් වැලකීමට කටයුතු කර ඇත. ලංසු ලේඛනයන්ට එවන් සංශෝධනයන් සිදු කිරීමට අවශ්‍ය වුවහොත් ඒ අවස්ථාවන්හීදී එම සංශෝධනයන්ට අනුගත වීම සඳහා සියලු සැපයුම්කරුවන්ට සාධාරණ කාලයක් ලබා දීමට කටයුතු කර ඇත.

04	ගල් අඟුරු ප්‍රසම්පාදනයේදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව සකස් කල යුතු ප්‍රසම්පාදන සැලැස්ම පරිපූර්ණ ලෙස විධිමත්ව සකස් කර අනුමත කර එයට අනුගතව කටයුතු කල යුතු වීම සහ කාලීනව ගල් අඟුරු සැපයීම තහවුරු වන පරිදි මූල්‍ය සම්පාදනයන් පිළිබඳව පූර්ව එකඟතාවයක් ලබා ගැනීමේ හැකියාව පිළිබඳව අවධානය යොමු කිරීම.	2022 වර්ෂයට අදාල ප්‍රසම්පාදන සැලැස්ම 2022.12.29 දිනද 2024 වර්ෂයට අදාල ප්‍රසම්පාදන සැලැස්ම 2023.12.07 දින අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලැබී ඇත.
05	එසේ එක් සැපයුම්කරුවකුට වැඩි සංඛ්‍යාවකගේ එකතුවකින් ප්‍රසම්පාදන සඳහා කටයුතු කරන්නේ නම් එම එකතුව නෛතික පුද්ගලභාවයක් ඇති බවට තහවුරු කරගත යුතු අතර එයට තිබිය යුතු ශක්‍යතාවයන් හා නෛතික බැඳීම් දැඩිව තහවුරු වන පරිදි ලංසු ලේඛන හා ගිවිසුම් ශක්තිමත් කර ගුණාත්මක ගල් අඟුරු තොග කාලීනව ලැබීම තහවුරු කර ගත යුතුය.	මේ සම්බන්ධව අවධානය යොමු කිරීමෙන් අනතුරුව විවෘත ජාත්‍යන්තර ටෙන්ඩර් ක්‍රියාවලියක් ආරම්භ කිරීමේදී ගල් අඟුරු සමාගම විසින් දැනට සැපයුම්කරුවකු ලියාපදිංචි කිරීමේදී මූල්‍ය හා තාක්ෂණික ශක්‍යතාවය ඇගයීමට ලක් කරනු ලබන අවම මූලික සුදුසුකම් ලංසු ලේඛනවල ලංසුකරුවන් ඇගයීමේ නිර්ණායක ලෙස ඇතුළත් කර ඇත. ලියාපදිංචි සැපයුම්කරුවන්ගෙන් ලංසු ලබාගැනීමේදී මෙම තත්වය බලපෑමක් සිදු නොවේ. මේ වනවිටත් විවෘත ලංසු කැඳවීමේදී සුදුසුකම් ලැබීමේ නිර්ණායක ලෙස (Eligibility criteria) වගන්ති 2.8 විවෘත ජාත්‍යන්තර ලංසු කැඳවීමේ ලේඛනයට ඇතුලත් කර ඇත.
06	ගල් අඟුරු ප්‍රසම්පාදනයට අදාළ සංයුක්ත දර්ශක තීරණය කිරීමේදී උපරිම ආර්ථික වාසියක් රජයට ලබා ගත හැකි පරිදි එම දර්ශක සකස් කිරීමට යොදා ගන්නා කලාපීය දර්ශක පිළිබඳව කාලීනව නැවත සලකා බැලීමට කටයුතු කල යුතුය.	මේ පිළිබඳව අවධානය යොමුකර කටයුතු කරන ලෙස අදාල අංශ වෙත දැනුම්දී ඇත. තවද අවිනිශ්චිත තාවයකදී රටට වඩාත් හිතකර දර්ශක භාවිතා කිරීම පිළිබඳ ජන හා සංඛ්‍යා ලේඛණ දෙපාර්තමේන්තුව වෙතින් ද මේ පිළිබඳ තවදුරටත් නිරීක්ෂණ ලබාගැනීමට ගල් අඟුරු සමාගම කටයුතු කර ඇත. තවද කොළඹ විශ්ව විද්‍යාලයෙන් ද මේ පිළිබඳ නිරීක්ෂණ ඉල්ලා ඇති අතර සියලු කලාපීය දර්ශකයන් පිළිබඳව කාලීනව නැවත සලකා බැලීමක් කරමින් වඩාත් වාසිදායක දර්ශක මත පිහිටා ප්‍රසම්පාදන කටයුතු සිදු කිරීමට අවශ්‍ය සැලසුම් සකස් කර ඇත.
07	2022 සැප්තැම්බර් 22 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයෙහි විවෘත ජාත්‍යන්තර ටෙන්ඩර් ක්‍රියාවලිය අනුගමනය කරමින් හා දැනට ලියාපදිංචි සැපයුම්කරුවන්ටද ප්‍රසම්පාදනයට සහභාගි වීමට අවස්ථාව ලබා දෙමින් ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කිරීමට අනුමැතිය ලබාදී තිබුණු අතර විවෘත ජාත්‍යන්තර ටෙන්ඩර් ක්‍රියාවලියක් ආරම්භ කිරීමේදී ගල් අඟුරු සමාගම විසින් දැනට සැපයුම්කරුවකු ලියාපදිංචි කිරීමේදී මූල්‍ය හා තාක්ෂණික ශක්‍යතාවය ඇගයීමකට ලක් කරනු ලබන අවම මූලික සුදුසුකම් ලංසු ලේඛනවල ලංසුකරුවන් ඇගයීමේ නිර්ණායක ලෙස ඇතුළත් කල යුතු බව නිර්දේශ කෙරේ.	මේ සම්බන්ධව අයිතම අංක 05 හි පිළිතුරු ලබාදී ඇත.

08	මෙම ප්‍රසම්පාදනයට `අදාළව වඩාත් ප්‍රශස්ත අනුමැතීන් ලබා දිය හැකි වන පරිදි අවශ්‍ය අධ්‍යයනයන් කිරීමට සහ තොරතුරු ලබා ගැනීමට ප්‍රමාණවත් කාලයක් අමාත්‍ය මණ්ඩලය වෙත ලැබෙන ලෙස නිවැරදි තොරතුරු අප්‍රමාදව ඉදිරිපත් කිරීමට අදාළ නිළධාරීන්ට නියම කිරීම.	ඒ අනුව කටයුතු කරමින් පවතී.

.....

සභාපති

ලංකා කෝල් පුද්ගලික සමාගම

Chairman
Lanka Coal Company (Pvt) Ltd.